මගේ අංකය / எனது இல. / My No. } RG/NB/11/2/35/ඉපාදු/2013

ඔබේ අංකය / உமது இல. / Your No. }

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone Nos. } 2889488 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No } 2889491

ඊමේල් / மின்னஞ்சல் / Email } info@rgd.gov.lk rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகத் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.rgd.gov.lk

දිනය / திகதி / Date: 2013.10.15

චක්‍රලේඛ අංක: 11/2013

සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් සහ

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 159 (ආ) උප වගන්තිය යටතේ**

**නිකුත් කරනු ලබන නිදහස් දීමනා පත්‍ර ලියාපදිංචි කිරීම.**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 159 (ආ) උප වගන්තිය හඳුන්වා දී තිබෙන්නේ ඉඩම් නිදහස් කිරීමේ ආඥා පනත යටතේ රජය විසින් නිදහස් කර දෙනු ලබන ඉඩම් සඳහා නිදහස් දීමනා පත්‍ර ලබා දීම පරමාර්ථ කොට ගෙනයි. ඒ අනුව අදාල ඉඩම් සඳහා රජය විසින් වැය කරන ලද මුදල් හිමිකරු වෙතින් ලබා ගැනීමෙන් අනතුරුව ඔහු වෙත 159 (ආ) උප වගන්තිය යටතේ කොන්දේසි විරහිත නිදහස් දීමනා පත්‍රයක් නිකුත් කරනු ලබයි.

02. එබැවින් අදාල දීමනා පත්‍රය මඟින් අයිතිකරුට දේපල පිළිබඳව පූර්ණ හිමිකමක් ලබා දෙන අතර එය වෙනත් කොන්දේසි වලට හෝ බැඳීම් වලට යටත් කොට නොමැති බැවින් එම ඉඩම හිමිකරුගේ පෞද්ගලික දේපලක් හා සමාන වන බව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක:4/පී/ම.ප/බස්නාහිර පළාත/කොළඹ හා 2013.02.01 දින දරණ ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.

03. ඒ අනුව ඉහතකී නීතිමය ප්‍රතිපාදන යටතේ නිකුත් කරනු ලබන දීමනා පත්‍ර ලියාපදිංචි කිරීමේදී මින් ඉදිරියට පෞද්ගලික ඉඩම් ලියාපදිංචි කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රම වේදයට අනුව ලි.ප. A4 ආකෘතිය (ඉඩම් ලේඛනය) භාවිතා කරමින් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකළ යුතු බවට මෙයින් දැනුම් දෙමි.

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
**රංජිත් දයානන්ද**
**නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්**

අත්සක් කළේ:- ඊ.එම්.ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්